4 වන පිටෙන්

දේශපාලන ව්‍යාපෘතියේ එක් පියවරක් ජයගෙන ඇත. මෛත්‍රී කිහිලිකරුව ඉවත් කර ගන්නා විට මහින්ද එහි ආධාරයෙන් කෙලින් වී සිටි අතර දැන් ඔහු ඒ කිහිලි කරුවේ හිලව්වට ගස්ගල් අතගාමින් කොර ඇන ඇන ඇවිදින්නට පටන් ගෙන තිබේ.

පක්ෂය සහ සන්ධානය නොකැඩී බේරා ගන්නට කළ පරිත්‍යාගවලට මෛත්‍රීට ලැබී ඇත්තේ මොනවාද? ඔහු කෙරෙහි විශ්වාසය තැබූ පිරිස් අතර යම් සැකයක්, අවිශ්වාසයක් ජනිත විය. එය ඉදිරියේ ක්‍රියා කරන ආකාරයෙන් ඉවත් කර ගන්නට බැරිකමක් නැත. එම අවිශ්වාසය, සැකය ඉවත් වන ලෙස විවෘතව ක්‍රියාකිරීම ජනපතිගේ වගකීමයි. ඉහත කී ගනුදෙනුව නිසා ඇතිවූ ලොකුම හානිය එය නොවේ. ජනාධිපතිවරයා ලෙස දිවුරුම්දීමත් සමග රට ප්‍රජාතන්ත්‍රවාදී මාවතේ ඉදිරියට ගෙනයාමට අවශ්‍ය පියවරයන් ගණනාවක් ගැනත මෛත්‍රී රට හමුවේ ප්‍රතිශ්‍රැවත් දුන්නේය. එවැනි පියවරයන් ගැනීමට අවංකව උත්සාහ දරාන බවද පෙන්වූයේය. ඒවා අතර නිස් අවුරුදු යුද්ධයෙන් දුරස්වී සිටින ජාතීන් අතර සංහිඳියාව ගොඩනැගීම, කුඩු ව්‍යාපාරිකයන්, එතනෝල් ව්‍යාපාරිකයන්, අපරාධකරුවන්, දූෂිතයන්ගෙන් තොර දේශපාලන බිමක් සහ යහපත් දේශපාලන සදාචාරයක් ගොඩනැගීම, දූෂණ, වංචා, නාස්ති පිටුදැකීම යන ඒවා ප්‍රධානය. තීරණාත්මකය.

මෛත්‍රී ප්‍රතිශ්‍රැවලට හරහට

කිහිලිකරු ව්‍යාපෘතිය හරහා නැගිට, ඇවිදිමින් සිටින මහින්දට ආණ්ඩුවක් පිහිටුවන්නට කෙසේවත් බලයක් නොලැබෙන බව ස්ථිරය. එහෙත් ඔහුගේ කල්ලියෙන් කිහිප දෙනෙකුවත් පාර්ලිමේන්තුවට එන බව පිළිනොගන්නට තරම් අපි අන්ධ විය යුතු නැත. ඒ සඳහා ඔවුන් උපරිම ශක්තිය යොදු ජාතිවාදී හැඟීම් අවුසන්සු ඇත. මෙය මෛත්‍රී ද හොඳින් දන්නා කාරණයකි. මහින්ද නාමයෝජනා ඉල්ලන විට ඔබ ආවොත් සුළුජාතීන්ගේ ඡන්ද කිසිවක් ලැබෙන්නේ නැතැයි තමා කියා සිටි බව 14 වැනිද ප්‍රකාශයේදී ඔහු කීවේය.



ප්‍රතිපත්තිවලින් නොව උපායෙන් බලය ඇල්ලීම සහ උපායෙන් එය රැකගැනීම ප්‍රධාන පක්ෂ දෙකම ප්‍රගුණ කර තිබේ.

එ සේ නම් දැන් මහින්ද කල්ලිය රට පුරා බේගල් ඇදබාමින් ජාතිවාදය අවුස්සන විට මෛත්‍රී අපේක්ෂා කරන ජාතින් අතර සංහිඳියාවට සිදු වන්නේ කුමක්ද? එ සේ ම මේ දූෂිත කල්ලියෙන් පිරිසක් ජනතාව රවටා පාර්ලිමේන්තුවට රංගා ගත් විට යහපත් දේශපාලන සදාචාරයක් ගොඩනගන්නට මෛත්‍රී දුන් ප්‍රතිශ්‍රැවට එයින් සිදු වන හානිය සුළුපටු නොවේ. 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ විට මහින්ද කල්ලිය හැසිරුණු ආකාරය පෙන්නුම් කළේ ප්‍රජාතන්ත්‍රවාදය දෙසට නැඹෙන පියවර වැළැක්වීමට ඔවුන් සියලු ශක්තිය යොදවන බවය. බැරිම තැන හැකිතරම් කප්පාදුවට ලක්කර නොකරම බැරි තැන 19 සම්මත කළඳ එහි ප්‍රධාන අංගයක් වන ව්‍යවස්ථාදායක සභාව ක්‍රියාත්මක කිරීම ඔවුහු කඩාකප්පල් කළහ. ඒ මහින් පිහිටුවීමට නියමිත ස්වාධීන කොමිෂන් සභා පත්කිරීම වැළැක්වූහ. ඒ අනුව ඔවුන්ගෙන් කිසියම් පිරිසක් සිටින පාර්ලිමේන්තුවකින් ප්‍රජාතන්ත්‍රවාදී ගමනට අපමණ බාධා එල්ල වනු ඇත.

ඔවුන් පාර්ලිමේන්තුවට පැමිණ ද සිටම 'පොලිස් මූලය අපරාධ කොට්ඨාශය අහෝසි කරනු, අල්ලස් හෝ දූෂණ විරෝදී කොමිසන විසැරුවනු, රහස් පොලිසියේ අනවල් නිලධාරීන් පන්නනු, ආදී වශයෙන් හඬ තලන්නට පටන් ගනු ඇත. පාර්ලිමේන්තුවේ හිඳියනු ඇත. එය ගවර වළක තත්වයට යළිත් පත්කරනු ඇත. මන්ත්‍රී වරප්‍රසාදවලට මුවාවී දූෂිතයන් අත්අඩංගුවට ගැනීම් වැළැක්වීමට වළිකනු ඇත. පසුගිය මාස හයේ ඔවුන්ගේ හැසිරීම් කියා පෑවේ එයයි.

උපාය නිවැරදිද?

දැන් ඒ මොහොතේ මෛත්‍රී පක්ෂයේ නායකත්වය බාර ගැනීම උපායශීලීව නිවැරදි යයි තර්ක කරන ඔහුගේ අලුත් න්‍යායධරයන් ඒ ගනුදෙනුවේ ලාබඅලාබ ගණන් බලා ශේෂපත්‍රය රට හමුවේ තබන්නේ නම් වටී. මේ න්‍යායධරයන්ගේ එක් තර්කයක් වන්නේ මෛත්‍රී එද එසේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ නායකත්වය බාර නොගතත්තේ නම් මහින්ද කල්ලිය එය තමන්ට ඕනෑ තැනට මෙහෙයවන බවය. මේ තර්කයේ පදනම වන්නේ 'ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නොබෙදී නොකැඩී සදකාලිකව පවතිනු ඇත, පැවතිය යුතුය' යන නිගමනයයි.

අප දකින විදියට නම් එය සාවද්‍ය නිගමනයකි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හෝ වෙනත් ඕනෑම දේශපාලන පක්ෂයක් යම් කාලවකවානුවකදී පවතින විෂයබද්ධ තත්වයන් මත කැඩී බිඳී යාම වැළැක්විය නොහැකිය. ක්‍රමයෙන් එහි ආරම්භක අරමුණුවලින් ඈතට තල්ලු වී යමින් තිබුණු ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පසුගිය වසර දහය තුළ රාජපක්ෂ පක්ෂයක් බවට පත්විය. එය නොබෙදී නොකැඩී පැවතීමේ ප්‍රධාන සහ එකම සාධකය වූයේ රාජ්‍ය බලයයි. ජනාධිපතිවරයා සතු අසීමිත බලතල යටතේ පැවති එහි, නායකත්වයට විරුද්ධ අදහස් දැරූවන් සිටියත් ඔවුන් නායකයා සතු අසීමිත බලය නිසා තම අදහස් යටපත් කරගෙන සිටි හැටි මෛත්‍රීම රටට කියා තිබේ. මෛත්‍රී මහලේකම් වී සිටියේද එම රාජපක්ෂ පක්ෂයේ ම ය. රාජපක්ෂ පවුල් පාලනය පෙරලා දමන්නට අවශ්‍ය බව පසක් කර ගත් විට ඔහුට එම පක්ෂයෙන් ඉවත්වන්නට සිදුවන්නේ ඒ නිසාය.

අවසන් මොහොතේ ඔහු සමග ඉවත්ව ආවේ මැති ඇමති කම් දැරූ ස්වල්ප දෙනෙකු බව සැබෑවකි. එහෙත් රටේ බලය මාරු වන්නේ නම් තවත් සැලකිය යුතු පිරිසක් පක්ෂය අතහැර එන්නට සූදානමින් සිටි බව ද ඒ හා සමානම සත්‍යයකි. රාජ්‍ය බලයට ගැටගැසූ පක්ෂයක හැටි එබඳුය. මෛත්‍රී ජනාධිපති බවට පත්වී දින හතරක් ගත වෙන්නටත් පෙර එම පක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායමේ හතලිස් ගණනක් මහින්ද අතහැර අවුත් මාධ්‍ය සාකච්ඡාවක් පවත්වමින් මෛත්‍රී තම නායකයා බව කියා සිටි හැටි අපට මතකය. ඔවුන් වැඩිදෙනෙකු එසේ ආවේ රට ගැන කැක්කුමකින් නොව ඒ වන විට එම පක්ෂයේ ස්වභාවය වූයේ රාජ්‍ය බලය පැත්තට හැරීම වන බැවිනි. 'අප්පච්චි මළා' යයි කීවේද එසේ ආ කෙනෙකි. පක්ෂයේ කෙනෙකු ජනාධිපති ලෙස පත්වන්නේ නම් ඔහු අනිවාර්යයෙන්ම පක්ෂයේ සභාපති වන්නේය යන අරමු පුදුම් කොන්දේසියක් පක්ෂ ව්‍යවස්ථාවට ඇතුළත් කර ගත් පක්ෂය වන්නේද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බව මෙහිදී සිහිපත් කර ගැනීම වැදගත්ය. එහිදී මහින්දගේ ප්‍රධාන අරමුණ වූයේ චන්ද්‍රිකා කුමාරණතුංග සභාපතිකමේන් පන්නා දැමීම වුවද ඒ හරහා පක්ෂය රාජ්‍ය බලයට ගැට ගැසීම ද සිදුවිය. එවැනි පක්ෂයක් රාජ්‍ය බලය ගිලිහී ගිය විට සිදුවිය හැක්කේ කුමක්ද යන්න තවත් පැහැදිලි කළ යුතු නැත.

පිළිලය කපා දැමිය හැකිව තිබුණා

අපගේ අදහස නම් රාජපක්ෂ පිළිලය ඉවත් කරගන්නට තිබුණු හොඳම වෙලාව වූයේ ජනාධිපතිවරණ ප්‍රතිඵලයත් සමගම පක්ෂයෙන් කොටසක් මහින්දගෙන් කැඩී තමා වෙත ආ අවස්ථාවය. මෛත්‍රීට තිබුණේ තව සති දෙකක් ඉවසා සිටින්නටය. එසේ වූයේ නම් මහින්ද හැර එන්නවුන්ගේ සංඛ්‍යාව අසූවක් පමණ වෙන්නට ඉඩ තිබුණි. එසේ වූයේ නම් 19 වැනි සංශෝධනය සම්මත කර ගන්නට ඔය තරම් පොර බදන්නට අවශ්‍ය වන්නේ නැත. එම සිදුවීමෙන් දින හතරක් යන්නට පෙර මහින්ද ඇතුළු පිරිස ඉදිරිපත්වී පක්ෂයේ සභාපතිකම මෛත්‍රීට පැවරුවේ ඔහුට හෝ පක්ෂයට ඇති ආදරයකට නොව ඔහු තිරකාරයකු කර ගන්නටය. මෙය මෛත්‍රී පාලනය බිඳින්නට අටවන උගුලක් බව මේ ලියුම්කරු ඒ අවස්ථාවේදීම ලියූ බවත් එම ලිපිය 'රාවය' සහ ඕස්ට්‍රේලියාවේ පළවන 'සන්නස' පුවත්පතේද පළ වූ බවත් මෙහි සඳහන් කරන්නේ එය සටහන් කර තැබීම වැදගත් බව පෙනෙන බැවිනි.

එසේ මහින්ද කල්ලිය විසින් උගුලක් ලෙස පක්ෂයේ සභාපතිකම බාර දෙන විට වහාම එය බාර ගත් නමුත් මාස හයක් දිවා රෑ පොර බැඳීමෙන් පසුව වත් එය බාරදුන් අය තම අදහස් පිළිගන්නා තැනකට පත් කර ගන්නට මෛත්‍රී අසමත් වන්නේ ඔහු ජනාධිපති හැටියට රටට දී ඇති ප්‍රතිශ්‍රැවලට ඒ අය මාරාන්තික ලෙස හතුරු බැවිනි. ඔවුන් හඬ නැගූ මෛත්‍රී-මහින්ද ආණ්ඩුවක් යන සටන් පාඩයේ අරමුණ වූයේ 'රාජ්‍ය බලය යළිත් අප අතට' යන්න මිස මෛත්‍රී සම නායකත්වයේ සැලකීමවත් නොවේ. පක්ෂයේ පැවැත්ම ඇත්තේ රාජ්‍ය බලය මතම බව මේ සටන්පාඩයේ නිර්මාතෘවරුන් හොඳින් දැන සිටියහ. දැන් මොවුන්ගේ ලොකුම ඝෝෂාව කුමක්ද? 'ජනාධිපති මොනවා කිව්වත් මහින්දට අගමැති වෙන්න පුළුවන්, අපි මහින්ද අගමැති කරනවා' මේ සඳහා නීති පොත් පෙරළමින් තරක කිරීම් නිමක් නැත. ඇයි මේ? රාජ්‍ය බලය නැතිව තම පක්ෂයට ජනතාව අතර පැවැත්මක් නැති බව මොවුන් දන්නා බැවිනි ඒ.

ප්‍රතිපත්තිවලින් නොව උපායෙන් බලය ඇල්ලීම සහ උපායෙන් එය රැකගැනීම ප්‍රධාන පක්ෂ දෙකම ප්‍රගුණ කර තිබේ. 'මට අවුරුදු හතලිස් නමයක දේශපාලන අත්දැකීම් තියෙනවා යයි මෛත්‍රී කියන විට එය අප තේරුම් ගන්නේ මමත් ඔය උපායන් හොඳින් දන්නවා යනුවෙනි. එහෙත් ඒ උපායන් නිසා දැන් මතුවී අත්තේ මහත් වියවුලකි. මෛත්‍රීට හිතවත් පිරිසක්ද සන්ධාන අපේක්ෂක ලැයිස්තුවේත් ජාතික ලැයිස්තුවේත් සිටින බව පැහැදිලිය. දැන් තමන් ජන්දය ඉල්ලන්නේ කෙසේද යන්න එම අපේක්ෂකයන්ට මහත් ගැටලුවක් වී තිබෙන හැටි පෙනේ. එසේම ඔවුන්ට ජන්දය දෙන්නට කැමති ජන්ද දායකයන්ටද ගැටලුවකි. ජන්දය ඉල්ලිය යුත්තේ පළමුව බුලත් කොළයටය. බුලත් කොළයට වැටෙන ජන්ද ගණන් ගැනෙන්නේ මහින්දට ලැබෙන ජන අනුමැතියක් හැටියටය. අපේක්ෂකයා එකතු කරන මනාපවලින් ඔහු අපේක්ෂා කරන දේට ප්‍රතිපක්ෂ ප්‍රතිඵලයකි ලැබෙන්නේ. එ සේ ම එවැනි අපේක්ෂකයකු වෙනුවෙන් වේදිකාවට කැඳවා ගන්නේ කවුද යන්න ද ගැටලුවකි. දූෂිතයකු නොවන එවැනි සමහර අපේක්ෂකයකු වෙනුවෙන් වේදිකාවකට නගින්නට සිවිල් සමාජ ක්‍රියාධරයකු, කලාකරුවකු කැමති වුවද මහින්ද නායකත්වය දෙන බුලත් කොළ වේදිකාවකට එවැන්නකු නගින්නේ කෙසේද? දුම්න්ද දිසානායක, මහින්ද අමරවීර වැනි අය තිරවී ඇති තරම මේ වන විටත් රට හමුවේ ප්‍රදර්ශනය වී තිබේ. එවැනි තවත් කිහිප දෙනෙකුම බෙල්ලටම තිරවී සිටිති. ඔවුන්ට මහින්ද පිලෙන් කැපිල්ල ද දියත් වෙයි. මහින්ද සමග නොසිටින අපේක්ෂකයන්ට ජන්දය දෙන්න එපා යයි මනුෂ නානායක්කාර ප්‍රසිද්ධ වේදිකාවේදීම කියනු ඇසිණ. එසේ කියන තවත් අය සිටිති. කෙසේ හෝ පාර්ලිමේන්තුවට රංගා ගැනීමේ අවශ්‍යතාව ඉටුකර ගැනීම සඳහා සහරුද අකමැත්තෙන් වුවද තමාද මහින්ද පිළේ සිටින කෙනෙකු බව පෙන්වති. මේ අය මේ බේදන්ත ප්‍රහසනයේ අද තමන්ට නියම වී ඇති චරිතය හැකිතරම් හොඳින් රඟපා පෙන්වන්නට දරණ උත්සාහය තුළ හාස්‍ය රසය නොමඳව මතුවෙයි.

පක්ෂය කැඩෙන්නට නියමිත අවස්ථාවේ එය කැඩෙන්නට හැරියේ නම් මෙවන් අවුලක් නිර්මාණය නොවනවා පමණක් නොව දිගුකලක් රාජ්‍ය බලය මත පැවතුණු පක්ෂයක් වන බැවින් එයින් කැඩෙන රාජ්‍ය බලය අහිමි මහින්ද පිළ කුඩා එකක් වී නුදුරේම අහෝසි වී යාමේ ඉරණමද එද ලියැවී තිබිණ. කෙසේ වුවද දැන් බරපතල අවුල නිර්මාණය වී තිබේ. නැවතත් රාජ්‍ය බලයේ සිහිනය මත මහින්ද පක්ෂයේ කොටසක් රවටා ගනු ඇත. ඒ සිහින බිඳ වැටෙන්නේ ජනතාව දැනුවත් වන ප්‍රමාණයටය. ඒ කටයුත්ත යළිත් පැවරෙන්නේ මෛත්‍රීගේ වචනවලින් නම් 'ජනවාරි 8 නිහඬ විප්ලවය' වෙනුවෙන් රට දැනුවත් කළ ක්‍රියාධරයන්ටය.

අපේ වගකීම

මේ රට ප්‍රජාතන්ත්‍රවාදී මාවතේ ඉදිරියට යනු දැකීමට කැමති සෑම පුද්ගලයෙකුම කළ යුතු වන්නේ මහින්ද කල්ලියෙන් වැඩි පිරිසක් පාර්ලිමේන්තුවට ඒම වැළැක්වීමට කළ හැකි සියලු දේ කිරීමයි. එහිදී බුලත් කොල ලැයිස්තුවේ මෛත්‍රීට හිතවත් අපේක්ෂකයන් කවුද ඔවුන් බේරා ගන්නේ කෙසේද යන්න ද්විතීයිකය.

මෛත්‍රී කිහිලිකරුව ගිලිහීමෙන් යළි අනාථ වී සිටින මහින්ද දැන් මහජනයාට පොරොන්දු මිටි ගණනින් බෙදමින් සිටී. රාජ්‍ය සේවකයන්ට, සමෘද්ධි ලාභීන්ට, තරුණ තරුණියන්ට, ගෘහණියන්ට, කම්කරුවන්ට, ගොවියන්ට, ධීවරයන්ට, විශ්‍රාමිකයන්ට, පොලිසියේ හමුදාවේ අයට, මෙකී නොකී සියලු දෙනාට ඉඩම්, නිවාස, රැකියා, වැටුප් වැඩිකිරීම්, ඩෝල්, සහ බඩුමිල අඩුකිරීම් ආදී සියලු දේ පොරොන්දු වෙයි. ඒ අතර පසුගිය පස්වසර තුළ සෑම ඡන්දයකදීම ලොකුම සටන්පාඩය කරගත් රට බේරාගත්තේ මෙයි, මම බේරාගත්තු රට දැන් අනතුරේ, ආපනු කොට නැගිටිනවා, රනිල්ලා රට පාවා දෙන්න ගිවිසුම් ගහලා' යයි බිල්ලන් මවමින් ජාතිවාදය අවුස්සයි. ජනාධිපතිවරණ කාලේ තිස්ස අත්තනායක ලවා ව්‍යාජ අත්සන් සහිත ලියවිල්ලක් පෙන්වමින් ඔහු කළ දේම දැන් තවත් වටයකින් දියත් කර තිබේ. ඡන්දදායකයන් ඔහුගෙන් ඇසිය යුත්තේ එකම ප්‍රශ්නයකි. අවුරුදු දහයක් සකල බලය සහිත ජනාධිපතිවරයා ලෙස සිටි ඔබ ඒ කාලයේ දෙන්නට බැරි වූ දේවල් මන්ත්‍රීවරයකු වී දෙන්නේ කොහොමද?

'අපි වැරදි කළා. සමහර වැරදි කරපු අය මම බලපෑම් කරල නිදහස් කළා. සමහරු පොලිසියෙ අතටම අතුවුණා .සමහරුන්ගෙ වැරදි මම වසන් කළා' පසුගිය අප්‍රේල් 21 වෙනිද හේනේගම පන්සලේදී මහින්ද රාජපක්ෂ තම කටින්ම කී දේ අපට මතක බව ඔහුට කිව යුතුය. දැන් මේ නැවත බලය ඉල්ලන්නේ එසේ වැරදි කළා යයි කී සියලු දෙනා සමගම නේද යන්නත් ඔහුගෙන් ඇසිය යුතුය. තමා බලපෑම් කර බේරා ගත් හොරුන් අපරාධකාරයන් කවුද? වසන් කළේ කාගේ හොරකම් වංචාද යන්න ඔහු කියා නැති නිසා දැන් ඔහුගේ කල්ලියේ එකී හොරුන් අපරාධකාරයන් සියලු දෙනාම සිටින බවය රටට පෙනෙන්නේ.

ඒ ප්‍රශ්නය අසන අතරම මේ රටේ අනාගත පරම්පරාවන් උකස් තබා ණයට ගත් කෝටි ගණන් මුදල් කොල්ලකෑම, කෝටි ප්‍රකෝටි ගණන් නාස්ති කිරීම, ඡන්ද අල්ලස්වලට රාජ්‍ය ආයතනවල මුදල් කෝටි ගණනින් වැයකිරීම, බැංකුවලට සහ වෙනත් රාජ්‍ය ආයතනවලට බොරු හැඳුනුම්පත් බොරු උප්පැන්න සහතික ඇතුළු බැලූබැල්මටම පෙනෙන ව්‍යාප් ලියවිලි ඉදිරිපත්කර බැංකු ගිණුම්, රාජ්‍ය තාන්ත්‍රික විදේශ ගමන් බලපත් ලබාගෙන ඒ මහින් මහාපරිමාන දූෂණ වංචාවල යෙදීම ඇතුළු නොයෙකුත් අපරාධ සම්බන්ධයෙන් ඔබවත් පවුලේ අයටත් ඔබේ කල්ලියේ මැති ඇමතීන්වත් විරුද්ධව කෙරෙන පරීක්ෂණ තවම අවසන් නැති බවත් මහජනයා ඒ පරීක්ෂණවල ප්‍රතිඵල මොනවාද යන්න දැන ගන්නට ඉවසිල්ලෙන් සහ සැලකිල්ලෙන් බලා සිටින බවත් ඔහුට මතක් කර දිය යුතුය.